**විවිධ විදේශාධාර ව්‍යාපෘතිය- (ප්‍රංශ රජයේ මූල්‍ය පැකේජය යටතේ පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීම) 2020**

විවිධ විදේශාධාර ව්‍යාපෘතියේ (පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීම) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රංශයේ නැටික්සිස් (NATIXIS) බැංකුව අතර 2012 නොවැම්බර් 05 දින එළඹි අංක බී 92 0ඒඅයි දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකනු ලබන අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග හා නාවික අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවට වානේ පාලම් 46 ක් සැපයීම ආරම්භක අවධියේ අරමුණ වූ අතර පසුව ණය මුදලේ ඉතුරුම් භාවිතයෙන් තවත් පාලම් 04 ක් එකතු කරන ලදී. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 7,564 කට සමාන යුරෝ මිලියන 45.80ක් වන අතර ඉන් රු.මිලියන 3,642කට සමාන යුරෝ මිලියන 22.05ක් සැපයීමට ප්‍රංශයේ නැටික්සික් (NATIXIS) බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජුලි මස ආරම්භ කරන ලද අතර 2015 ජුලි නිමකිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, ඉඩම් අත්පත්කර ගැනීම් කටයුතු අවසන් කර නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය 2017 වර්ෂයේ දී අවසන් කර තිබුණද, ව්‍යාපෘතිය නිමකර ඇවර කිරීමේ අවසන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. එමනිසා, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පවත්වා ගෙන යනු ලබන අතර ඒ සඳහා අනවශ්‍ය පරිදි මුදල් ප්‍රමාණයක් වියදම් කර තිබුණි. | එකඟ වේ. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2017 දී අවසන් කර තිබුණි. කෙසේවෙතත්, 2020 වර්ෂය දක්වා ඉඩම් අත්පත් කර ගැනීමේ ගෙවීම් සිදුකර තිබුණු අතර සියලුම වගකීම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී 2020 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ඇවර කිරීමේ ගිණුම් පිළියෙල කිරීමට තීරණය කර තිබුණි. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් වූ වහාම ව්‍යාපෘතිය වසා දැමීමට සහ ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

## 2.1 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ලැබී තිබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතිය සඳහා රජයේ ඉඩම් කොටස් 17ක් ඇතුලුව ඉඩම් කොටස් 224ක් අත්පත් කර ගැනීමට නියමිත විය. 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ඉඩම් කොටස් 87ක් සඳහා රු. මිලියන 33.40ක වන්දි මුදලක් හා වන්දි ගෙවීම් නිරවුල් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් රු. මිලියන 5.66ක පොළී මුදලක් ගෙවා තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු 2013 ජූලි ආරම්භ කර තිබුණු අතර වර්ෂ 7½ ක් අවසන් වී තිබුණද, 2020 දෙසැම්බර් 31 දිනට සියයට 58 නියෝජනය කරන ඉඩම් කොටස් 120ක් අත්කර ගැනීමේ කටයුතු නිම කිරීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ඉඩම් කොටස් 08ක් පමණක් ලියාපදිංචි කර තිබුණු බව නිරීක්ෂණය විය. | එකඟවේ. ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවලට සම්බන්ධ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහ තක්සේරු දෙපාර්තමේන්තුවේ පුද්ගලයින්ගේ ප්‍රමාදයන් සිදු වී ඇත. | ඉලක්කගත දිනයන්ට ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිම කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ නිසි සම්බන්ධතාවක් පවත්වා ගැනීමට පියවර ගත යුතුය. |